# <u>153 වන පොලිස් විරු සමරු දිනය අභිමානයෙන් සමරමු.</u>

ශ්‍රී ලංකා පොලීසිය සිය 150 වන සමරුම් උත්සවය පවත්වනු ලැබුවේ 2016 සැප්තැම්බර් මස 03 වන දිනය. එහෙත්, **මෙවර ශ්‍රී ලංකා පොලීසිය සමරනු ලබන්නේ 153 වන පොලිස් විරු සමරු දිනයයි**.

සංවිධානාත්මකව පොලිස් සේවය ආරම්භ කිරීමට වසර දෙක කට පෙර එනම්, 1864 මාර්තු මස 21 වන දින කන්ද උඩරටට ප්‍රවේශ වන මාවනැල්ල නගරයට ආසන්න උතුවන්කන්ද ප්‍රදේශයේදී සරදියල් ඇතුළු දාමරිකයන් අත්අඩංගුවට ගැනීමට දියත් කල ක්‍රියාන්විතයේදී සරදියල්ගේ සාහචරයා වූ මම්මලේ මරික්කාර් සිදුකළ වෙඩි තැබීමකින් පොලිස් කොස්තාපල් සභාන් වීර වික්‍රමාන්විතව දිවි පිදුවේ අද වැනි දිනකදීය.

1864 මාර්තු මස 21 වන දින සිදුවූ මෙම සිද්ධිය මුල්කරගෙන සෑම වසරකම මාර්තු මස 21 වන දින පොලිස් විරු දිනය සමරනු ලබයි.

මෙවරද පොලිස් විරු සමරු දිනයේ ප්‍රධාන උත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ පොලිස්පති ධූරන්ධර පූජිත් සේනාධිබංඩාර ජයසුන්දර මහතාණන් ගේ ප්‍රධානත්වයෙන් බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ ඉදිකර ඇති ප්‍රධාන විරු ස්මාරකය අබියසදී පැවැත්වෙන අතර, 1864 මාර්තු 21 වන දින පොලිස් කොස්තාපල් සභාන් වීර වික්‍රමාන්විත ලෙස දිවි පිදූ මාවනැල්ල නගරය අසල පිහිටි ස්මාරකය අබියස විශේෂ විරුසමරු උත්සවයක් ද, 1990 ජූනි 11 වන දින පොලිස් නිලධාරීන් 400 ක් දිවිපිදූ අම්පාර රූපස්කුලම් ප්‍රදේශයේ ඉදිකර ඇති විරු ස්මාරකය අබියස විශේෂ විරු සමරු උත්සවයක්ද පැවැත්වේ.

යම් ජන කොටසකගේ සාමය, සුරක්ෂිතභාවය ආරක්ෂා කරනු පිණිස යමෙකුට කල හැකි උතුම්ම ක්‍රියාව වන්නේ ඒ ශ්‍රේෂ්ඨ අරමුණ වෙනුවෙන් සිය ජීවිතය පූජා කිරීමය. එවැනි උතුම් දිවි පිදුම් සිදුකළ සෑම අයෙකුම ඉතිහාසයට එක්ව ඇත්තේ විරුවන් සහ වීරවරියන් ලෙසය. අද දින අප සිහිපත් කරනු ලබන්නේ එලෙස දිවිපිදූ විරුවන් හා වීරවරියන් ගේ ඒ ශ්‍රේෂ්ඨ ක්‍රියාවයි.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවධියේ පටන් මේ මොහොත දක්වා අවස්ථා රැසකදී මානව සමාජයේ ශිෂ්ටසම්පන්න භාවය, යහපැවැත්ම උදෙසා දිවි පිදූ

විරුවන් සහ වීරවරියන් සැමදා ජනතාවගේ හදවත් තුළ ජීවත්වෙමින් ජනතාව වෙතින් පිදුම් ලැබීම සිදුවන බව අප පසක් කර ගත යුතු සත්‍යයකි.

තම මාතෘ භූමියේ ස්වරීත්වය, සුරක්ෂිතභාවය මෙන්ම මහජනතාවගේ සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් පොලිස් කොස්තාපල් සභාන්ගේ සිට අද දින දක්වා පොලිස් විරුවන් මෙන්ම වීරවරියන් 3111 ක් සිය රුධිරයෙන් මෙම මාතෘ භූමිය දෝවනය කල බව ලාංකේය මහජනතාව සැමදා කෘතවේදීව සිහිපත් කරනු ඇත. එසේ දිවිපිදූ පොලිස් විරුවන් අතර විහාරමහා දේවියගේ පරපුර නියෝජනය කරන වීරවරියන් 15 දෙනෙකු ද වේ.

1864 සිට 1971 දක්වා වූ වසර 107 තුළ පොලිස් විරුවන් 65 දෙනෙක් වීර වික්‍රමාන්විත ලෙස දිවි පුදා ඇති අතර, 1971 අප්‍රේල් කැරැල්ලට මුහුණදීමෙන් පොලිස් විරුවන් 38 දෙනෙක් දිවිපුදා ඇත්තේ ශ්‍රී ලංකීය ජනතාවගේ පරමාධිපත්‍ය සුරැකීමේ අරමුණ පෙරදැරිවය. 1988 - 89 වර්ෂයන් තුළ දකුණේ ක්‍රියාත්මක වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් පොලිස් විරුවන් මෙන්ම වීරවරියන්ද 357 දෙනෙක් ජීවිත පූජා කරන ලද්දේ භීෂණය තුරන් කිරීම සඳහාය.

1978 පෙබරවාරි මස 14 වන දින කන්කසන්තුරේදී දිවි පිදූ පොලිස් කොස්තාපල් 3164 කරුණානිධි ද්‍රවිඩ ත්‍රස්තවාදී යුද්ධය හේතුවෙන් ජීවිතය පූජා කල යුද, නාවික, ගගන , පොලිස් සාමාජිකයන් අතර පළමුවැන්නා ලෙස ඉතිහාසයට එක්වී ඇත. සමස්ත ද්‍රවිඩ ත්‍රස්තවාදී අරගලය තුළ පොලිස් විරුවන් සහ වීරවරියන් 2594 දෙනෙක් මාතෘ භූමියේ ස්වරීත්වය වෙනුවෙන් වීර වික්‍රමාන්විත ලෙස දිවි පුදා ඇති බව නිදහස අත්විඳින සියලු ලක්වැසියන් සිහිපත් කරන්නේ ගෞරවාභිමානයෙනි.

මෙරට ජනතාවගේ සාමය සහ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් දිවි පිදූ පොලිස් විරුවන් 3111 ට අමතරව පූර්ණ හා අර්ධ අබාධිත තත්වයට පත්වූ නිලධාරීන් මෙන්ම නිලධාරිනියන් ද 639 දෙනෙකු තම අනාගතය අප මාතෘ භූමිය වෙනුවෙන් කැප කර සිටින බව අප අවබෝධ කර ගත යුතු කරුණකි.

දිවිපිදූ විරුවන් මෙන්ම අබාධිත තත්වයට පත්ව ඇති විරුවන් ඔවුන්ගේ හෙට දවස සහෝදර ජන කොටසකගේ අද දවස සුරක්ෂිත කිරීමේ මහා හැඟි කාර්යකට කැපකර ඇත්තේ කිසිදු පෞද්ගලික ලාභ ප්‍රයෝජන පතා

නොවේ. එමෙන්ම දිවි පිදූ විරුවන්ගේ සහෘදයන් මෙන්ම අබාධිත විරුවන් හා ඔවුන්ගේ සහෘදයන් සැමදා සිහිපත් කිරීම ඔවුන් ආදරයෙන් රැක බලා ගැනිමේ වගකීමද අප සැම ඉදිරියේ ඇති අභියෝගයකි.

පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාණන්ගේ විශේෂ අවධානය පොලිස් විරු සුබ සාධනය පිළිබඳව යොමුවී ඇත. ඒ අනුව,

- යුද ආබාධිත නිලධාරයන් වෙනුවෙන් ගෙවනු ලබන සියලුම දීමනා, නිතිය ආරක්ෂා කිරීමේ රාජකාරි වලදී ආබාධිත තත්වයට පත්වන නිලධරයන් වෙනුවෙන්ද ඒ හා සමානව ගෙවීම,
- නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ රාජකාරීයේ යෙදී සිටියදී සිදුවන ආබාධ හේතුවෙන් විශ්‍රාම ගන්වා ඇති වසර 10 සේවා කාලයක් සපුරා නොමැති නිලධරයන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම,
- මීරිගම වල්බොතලේ පොලිස් රණවිරු ගම්මානයේ පොලිස් විරුවන්ගේ පවුල් සඳහා නිවාස ඉදිකර දීම,
- පොලිස් රෝහල් තුළ පොලිස් විරුවන්ගේ යැපෙන්නන් සඳහාද ප්‍රමුඛතාවය හිමිකර දීම,

ආදිය සිදුකීරිමට නියමිත අතර මේ වන විටත් ක්‍රියාත්මක සුබසාධන වැඩසටහන් වන,

- පොලිස් සේවා වනිතා ඒකකය මඟින් ක්‍රියාත්මක කරන පොලිස් විරුවන් වෙනුවෙන් සහ ඔවුන්ගේ පවුලවල යැපෙන්නන් සඳහා නිවාස ආධාර ලබාදීම,
- පොලිස් විරු පවුල්වල දරුවන් සඳහා පාසල් අධ්‍යාපන ශිෂ්‍යත්ව හා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව පිරිනැමීම,
- දරුණු රෝගාබාධ සඳහා වෛද්‍ය ආධාර පිරිනැමීම,
- වාර්ෂිකව සිංහල හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් මියගිය පොලිස් විරුවන්ගේ යැපෙන්නන් සඳහා වියළි ආහර සහන මල්ලක් නිවසට ගොස් පිරිනැමීම,

- මියගිය නිලධරයන්ගේ යැපෙන්නන් සඳහා හා ආබාධිත නිලධරයන් සඳහා නම් කරන ලද ආයතන 43 කින් වරප්‍රසාද හිමිකර ගත හැකි "**විරුසර**" නමින් කාඩ්පතක් ලබාදී තිබීම,

- පොලිස් පවුල් සුභසාධක සංගමය මඟින් පොලිස් විරුවන් වෙනුවෙන් සහ ඔවුන්ගේ යැපෙන්නන් වෙනුවෙන් නිවාස ඉදිකිරීමට සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පොලී රහිත ණය ආධාර ලබා දීම, ආදිය සිදුකරන බව විශේෂයෙන් සඳහන් කල හැක.

ශ්‍රී ලංකා පොලීසිය, වසර 150 සිය විශිෂ්ටත්ව ගමන තුළ ශ්‍රී ලාංකේය ජනතාවගේ සාමය , සුරක්ෂිතභාවය සුරැකීමේ අභියෝගයට නොපැකිලව , නොබියව මුහුණ දී සිටී. ලක්වැසියන් ගේ සාමයට අභියෝග එල්ලවූ සෑම අවස්ථාවකදීම පෙරමුණ ගෙන ඇත්තේ පොලිස් විරුවන්ය. එය 1971 දී වැල්ලවායෙන් ද, 1978 දී කන්කසන්තුරේන්ද, 1988 දී කොළඹ ප්‍රදේශය මුල් කරගනිමින් සිදුවූ සිද්ධි වලින් ද පැහැදිලි වේ.

සියලු අභියෝග හමුවේ නොසැලෙන ඉන්ද්‍රකීලයක්සේ සිටිමින් රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ හා ආබාධයට ලක් වූ පොලිස් විරුවනි , වීරවරියනි , හිරු නැගෙන විටත් හිරු  බැසයන විටත් සියලුම කෘතවේදී ශ්‍රී ලාංකිකයන් ඔබ සැමව සිහිපත් කරන්නේ හදබැතියෙන්ය.

දෙන මුත් දිවි රට වෙනුවෙන් -   ජාතික දරුවන් ලැබුවෙන්
මිදී නොයෙක් සතුරු මුවෙන්  -  ලක් මව් සැනසේය සුවෙන්

( ටිබෙට්.එස්.මහින්ද හිමි)



ප්‍රියන්ත ජයකොඩි
නියෝජ්‍ය පොලිස්පති
පොලිස් මාධ්‍ය ප්‍රකාශක.